# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,473 - 2026 ජනවාරි මස 23 සිකුරාදා - 2026.01.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 20 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 23 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තතු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 පෙබරවාරි මස 13 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජනවාරි මස 30 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2026 ජනවාරි මස 01 වැනි දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

19 - B 082757 - (2026/01)
E - 01

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

වයඹ පළාත් සභාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/ ඩබ්ලිව්. ආර්. ඒ. සාගරිකා සී. හේරත් වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් එක්දහස් නවසිය අසූ හයක් වූ මැයි මස දොළොස් වන (1986.05.12) දින ප්‍රදානය කර ඇති අංක. කුරු/ප්‍ර 13775 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන මැල්සිරිපුර, රාගෙදර යන ලිපිනයෙහි පදිංචි කිරිඇල්ලේ ගුරුන්නාන්සේලාගේ ජේපින් වෙත ප්‍රදානය කොට කුරුණෑගල දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක B/16/789/88 යටතේ 1988/06/23 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එම දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2026.02.13 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

### උපලේඛනය

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉහළ ඕතොට කෝරළේ 130 කැන්දවල (නව 506-රාගෙදර) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ රාගෙදර නැමැති ගමේ පිහිටා ඇත්තා වූද, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක 8 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක 2739 දරන පිඹුරෙහි අංක 517 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් බින්දුවයි දශම එකයි අටයි හයක් (0.186) ක් ඇතැයි ගණන් බලා තිබෙන ගල්පොත්තයාය, රාගෙදරමූකලාන යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම

| | |
|---|---|
| *උතුරට* | : ප්‍රවේශ මාර්ගය |
| *නැගෙනහිරට* | : ප්‍රවේශ මාර්ගය |
| *දකුණට* | : කැබලි අංක 518 |
| *බස්නාහිරට* | : ප්‍රවේශ මාර්ගය |

ඩබ්ලිව්. ආර්. ඒ. සාගරිකා සී. හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
ඉබ්බාගමුව.

2025 සැප්තැම්බර් මස 25 වැනි දින.

01-243/1

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

වයඹ පළාත් සභාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් දිසානායක මුදියන්සේලාගේ අනුර කුමාර දිසානායක වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1984.02.22 දින ප්‍රදානය කර ඇති අංක කුරු/ප්‍ර 07739 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන වැවගම, ඉදිපිටිය වත්ත පදිංචි කරුණාපේඩි දූරයලාගේ ගරු වෙත ප්‍රදානය කොට කුලියාපිටිය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක කුලි/කේ 08/151 යටතේ 1990 මාර්තු 16 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එම දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2026.02.13 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

### උපලේඛනය

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මයුරාවතී කෝරළේ 1096 වැවගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බලගම්මන නමැති ගමේ පිහිටා ඇත්තාවූද, සර්වේයර් ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේයර් ජනරාල්වරයා සම්පාදිත අංක 3 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක 958 දරන පිඹුරෙහි අංක 43 බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.056 ක් විශාලත්වය ඇත්තාවූද, පහත දැක්වෙන පරිදි මායිම් වූද ඉදිපිටියවත්ත නැමැති රජයේ ඉඩම

| | |
|---|---|
| *උතුරට* | : ප්‍රවේශ මාර්ගය |
| *නැගෙනහිරට* | : කැබලි අංක 42 |
| *දකුණට* | : කැබලි අංක 44 |
| *බස්නාහිරට* | : ප්‍රවේශ මාර්ගය |

ඩී. එම්. ඒ. කේ. දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
කුලියාපිටිය. (බටහිර)

2023 අගෝස්තු මස 04 දින.

01-243/2

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

වයඹ පළාතේ දන්කොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් ජයසිංහ ආරච්චිගේ විජානි වසන්තිකා වන මට ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982 අප්‍රේල් මස 29 වන දින ප්‍රදානය කර ඇති පුත්/වෙන්/ප්‍ර/642 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කහටවිල, මඩවලපිටියවත්ත පදිංචි රණතුංග මුදියන්සේලාගේ ජේන්නෝනා වෙත ප්‍රදානය කොට මාරවිල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක වෙන්/4/153 යටතේ 1985.02.15 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇත. එබැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට 2026 පෙබරවාරි මස 13 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

පුත්තලම දිස්ත්‍රික්කයේ දන්කොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු පිටිගල් කෝරලේ පොතුවටවන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කහටවිල නැමැති ගමේ පිහිටා ඇති සර්වේ ජනරාල් විසින් සම්පාදිත අංක අයි 16/56 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි පුත්තලම මැනුම් අධිකාරි විසින් සම්පාදිත අංක පි. පි. පු. 27 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 02 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇති ප්‍රමාණයෙන් පර්චස් තිස්දෙකයි දශම දෙකක් විශාල මඩවලපිටියවත්ත නැමති රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඇල්. ඇම්. පෙරේරාට අයත් කොහිලගොඩැල්ල නැමැති පොල් ඉඩම සහ කැබලි අංක 50 |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 50 සහ කැබලි අංක 03 |
| *දකුණට* | : | කැබලි අංක 03 සහ ජේ. ඒ. අන්ද්‍රාදූට අයත් මැදමූකලානවත්ත නැමැති පොල් ඉඩම සහ ටීපී 225587 |
| *බස්නාහිරට* | : | ඇම්. ඇල්. පෙරේරාට අයත් කොහිල ගොඩැල්ල නැමැති පොල් ඉඩම ඇස්. ඇම්. බණ්ඩප්පුහාමිට අයත් බ. අ. අංක 10090 යටතේ දී ඇති බදු ඉඩම ටී. පී.225587 සහ ජේ. ඒ. අන්ද්‍රාදූට අයත් මැදමූකලානවත්ත නැමැති පොල් ඉඩම |

ජේ. ඒ. විජානි වසන්තිකා,
ප්‍රාදේශීය ලේකම්,
දන්කොටුව.

2025 ජුනි මස 30 දින.

01-284

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

සබරගමුව පළාත් සභාවේ, රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් නානායක්කාර ගිංතොට විදානගේ චින්තන උදාර වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2017.06.23 දින ප්‍රදානය කර ඇති අංක GR/24/037023 ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අක්කර 25, පැල්වාඩිය, රත්නපුර පංදිංචි දංගහදෙනිය වෙදාලාය මිසිනෝනා (ජීවිත භුක්තිය) වෙත ප්‍රදානය කොට රත්නපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ඉසං K/07/89 යටතේ 2017.11.17 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එම දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2026.02.13 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කයේ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුරුවිට කෝරළේ මැද පත්තුවේ කොළඳගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පැල්වාඩිය නැමැති ගමේ පිහිටා ඇත්තා වූද රත්නපුර මිනින්දෝරු අධිකාරී භාරයේ ඇති සහ සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත ක්ෂේත්‍ර පත්‍ර අංක 10 අවසාන ගම් සිතියම් අංක 32 හි කැබලි අංක 117 දරන, හෙක්ටයාර් 0.176 විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූද රජයේ ඉඩම වැලිමළුව වත්ත (ඉඩමේ නම)

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 109 |
| *නැගෙනහිරට* | : කැබලි අංක 116 |
| *දකුණට* | : කැබලි අංක 108 |
| *බස්නාහිරට* | : කැබලි අංක 108 |

චින්තක උදාර නානායක්කාර,
ප්‍රාදේශීය ලේකම්,
රත්නපුර.

2025 සැප්තැම්බර් මස 22 දින.

01-252

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

බස්නාහිර පළාත් සභාවේ ගම්පහ දිස්ත්‍රික්කයේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් යූ. ඩබ්ලිව්. ටී. යූ. රාජකරුණා වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1984.10.18 දින ප්‍රදානය කර ඇති අංක ගම්/ප්‍ර/මීනු/97 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන නයිවල පැල වගාව, මීනුවන්ගොඩ පදිංචි අගම් පොඩිගේ පියරත්න වෙත ප්‍රදානය කොට ගම්පහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 06/87 යටතේ 1987.03.19 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එම දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2026.02.13 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දාසිය පත්තුවේ 99 නාලපහ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නයිවල නමැති ගමේ පිහිටා ඇත්තාවූද, සර්වේයර් ජනරාල් භාරයේ ඇති සහ සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත මු. පි. කො. 570 දරන කට්ටි කැඩීමේ පිඹුරෙහි අංක 52 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොටඇත්තාවූ ද, ප්‍රමාණයෙන් රූඩ් 01, පර්චස් 03 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ නයිවල පැල වගාව නමැති රජයේ ඉඩම

| | |
|---|---|
| *උතුරට* | : ප්‍රවේශ පාර |
| *නැගෙනහිරට* | : ප්‍රවේශ පාර |
| *දකුණට* | : කට්ටි අංක 53 |
| *බස්නාහිරට* | : නයිවල පැල වගාව හිපි 77192 |

යූ.ඩබ්ලිව්. ටී. යූ. රාජකරුණා,
ප්‍රාදේශීය ලේකම්,
මීනුවන්ගොඩ.

2025 නොවැම්බර් මස 17 වැනි දින.

01-285/1

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

බස්නාහිර පළාත් සභාවේ ගම්පහ දිස්ත්‍රික්කයේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් යූ. ඩබ්ලිව්. ටී. යූ. රාජකරුණා වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1984.10.16 දින ප්‍රදානය කර ඇති අංක ගම්/ප්‍ර/3051 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කෝපිවත්ත, යටියන, මීනුවන්ගොඩ පදිංචි දූනු කුමාරගේ වික්ටර් පෙරේරා වෙත ප්‍රදානය කොට ගම්පහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක මිග/මීනු/01/276 යටතේ 1987.11.29 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එම දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2026.02.13 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

බස්නාහිරට පළාතේ ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දාසිය පත්තුවේ 123 යටියන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ යටියන නමැති ගමේ පිහිටා ඇත්තාවූද, සර්වේයර් ජනරාල් භාරයේ ඇති සහ සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත මු. පි. ගම්. 426 දරන කට්ටි කැඩීමේ පිඹුරෙහි අංක 140 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.091 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ කෝපියාවත්ත නැමැති රජයේ ඉඩම.

| | |
|---|---|
| *උතුරට* | : ප්‍රවේශ පාර |
| *නැගෙනහිරට* | : කට්ටි අංක 141 |
| *දකුණට* | : කෝපියාවත්ත |
| *බස්නාහිරට* | : කට්ටි අංක 139 |

යූ.ඩබ්ලිව්. ටී. යූ. රාජකරුණා,
ප්‍රාදේශීය ලේකම්,
මීනුවන්ගොඩ.

2025 නොවැම්බර් මස 26 දින.

01-285/2

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/68883.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* NP/28/04/02/
SLO/45/1696.

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ කන්ඩාවලෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක KN /45 උමෙයාල්පුරම් ග්‍රාම නිලධාරි වසමේ පරන්තන් ගමේ අනුරේඛන අංක KI/KND/2025/220 කැබලි අංක A වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 12.1406 ක්වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ් නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | |
|---|---|
| *උතුරට* | : කැ. සි. 920045 කලාප 01 පත්‍ර 01 |
| *නැගෙනහිරට* | : P. P. යා 1041 කැබලි අංක 13 |
| *දකුණට* | : කැබලි අංක B සහ C |
| *බටහිරට* | : කැබලි අංක C |

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහයි. (30) (2025.12.19 දින සිට 2055.12.18 දින දක්වා);

*(ආ)* *වාර්ෂික බදු මුදල* .- 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ (රු. 5,000,000) හෝ රුපියල් මිලියන පහකට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල* : වාර මුදලක් අය නොකෙරේ.

*(ඇ)* මෙම ඉඩම වාණිජ කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2025.12.19 සිට අවුරුදු 05ක් ගත වන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවක දී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10%ක දඩ පොළියක් අය කරනු ලැබේ.

මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

තුසිත ගලප්පත්ති,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2026 ජනවාරි මස 08 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ අංක 1200/6 හි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

01-253

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* LTL/44/1345.

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

මුලතිවු දිස්ත්‍රික්කයේ පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක MU/42 කෝම්පාවිල් ග්‍රාම නිලධාරි වසමේ කෝම්පාවිල් ගමේ ජනපද නිලධාරී විසින් අඳින ලද හා ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද දළ අනුරේඛනයේ ප්‍රමාණයෙන් හෙක් 0.2023 ක් වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා කමලනාදන් නකුලේශ්වරන් මයා නමින් බදු ඉල්ලා ඇති බව මෙයන් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | |
|---|---|
| *උතුරට* | : රජයේ ඉඩම |
| *නැගෙනහිරට* | : රජයේ ඉඩම |
| *දකුණට* | : ම. පකීරතන්ගේ ඉඩම |
| *බටහිරට* | : පටුමග |

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහයි. (30) (2025.04.10 දින සිට 2055.04.09 දින දක්වා);

*(ආ)* *වාර්ෂික බදු මුදල* .- 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ (රු. 5,000,000) හෝ රුපියල් මිලියන පහකට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල* : වාර මුදලක් අය නොකෙරේ.

*(ඇ)* මෙම ඉඩම වාණිජ කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2025.04.10 සිට අවුරුදු 05ක් ගත වන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවක දී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10%ක දඩ පොළියක් අය කරනු ලැබේ.

මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

තුසිත ගලප්පත්ති,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2026 ජනවාරි මස 08 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර,
"මිහිකත මැඳුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ අංක 1200/6 හි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

01-254

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/76055.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* NP/28/04/02/44/OD/3067.

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

මුලතිවු දිස්ත්‍රික්කයේ ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් තිරුමුරිකන්ඩි ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වසන්තනගර් ගමේ ජනපද නිලධාරී විසින් සකසන ලද දළ අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් අක්. 01 ක් පමණ වූ රජයේ ඉඩම් කොටසක් ආගමික කටයුතු සඳහා ලංකා පෙන්තකොස්ත සභාවේ භාරකාර මණ්ඩලය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ. :

| | |
|---|---|
| *උතුරට* | : පාර |
| *නැගෙනහිරට* | : රජයේ ඉඩම් |
| *දකුණට* | : රජයේ ඉඩම් |
| *බටහිරට* | : පාර |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහයි. (30) (2025.12.05 දින සිට 2055.12.04 දක්වා);

*(ආ)* *වාර්ෂික බදු මුදල* .-ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, ගරු ඇමතිතුමා අනුමත කරන වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2% කි.

*වාර මුදල* : අය නොකෙරේ.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම ආගමික කටයුතු හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදිය යුතුය.

*(ඈ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙමම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2025.12.05 දින සිට වසර පහක් ගතවන තුරු අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවක දී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10%ක දඩ පොලියක් අය කරනු ලැබේ.

මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

තුසිත ගලප්පත්ති,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2026 ජනවාරි මස 06 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර,
“මිහිකත මැදුර”,
ඉඩම් මහලේකම් කාර්යාලයේ අංක 1200/6 හි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

01-257

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/63241
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : NCP/PLC/L5/MT/04/2020.

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මිහින්තලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 580, වෙල්ලාරගම ග්‍රාම නිලධාරි වසමේ වෙල්ලාරගම ගමේ බලයලත් මිනින්දෝරු විසින් සකසන ලද අනුරේඛනයේ කැබලි අංක 01 න් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 5.2960 ක් වූ රජයේ ඉඩම් කොටස කෘෂිකාර්මික කටයුත්තක් සඳහා අලුත් ගෙදර වික්ටර් රණසිංහ මයා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | |
|---|---|
| *උතුරට* | : ආර්. කේ. ගොවිපළ |
| *නැගෙනහිරට* | : අතුරු පාර මාර්ග රක්ෂිතය |
| *දකුණට* | : වන රක්ෂිතය හා සුරංග සහ තවත් අයගේ හේන් |
| *බටහිරට* | : සෙනෙවිරත්නගේ හේන සහ පාර |

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහයි. (30) (2020.07.15 සිට 2050.07.14 දක්වා);

*(ආ)* *වාර්ෂික බදු මුදල* .- 2020 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි. 2020 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ හෝ පහකට (රු. 5,000,000) වඩා වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ට නොවැඩි විය යුතුය.

*වාර මුදල* : වාර මුදලක් අය නොකෙරේ.

*(ඇ)* මෙම ඉඩම කෘෂිකාර්මික කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2020.07.15 සිට අවුරුදු 05ක් ගත වන තුරු අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවක දී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10%ක දඩ පොළියක් අය කරනු ලැබේ.

මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2026 ජනවාරි මස 14 දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර,
“මිහිකත මැදුර”,
ඉඩම් මහලේකම් කාර්යාලයේ අංක 1200/6 හි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

01-308

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/63242.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* : NCP/PLC/L5/MT/04/2020.

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මිහින්තලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 580, වෙල්ලාරගම ග්‍රාම නිලධාරි වසමේ වෙල්ලාරගම ගමේ බලයලත් මිනින්දෝරු විසින් සකසන ලද අනුරේඛනයේ කැබලි අංක 01 සහ කැබලි අංක 02 මගින් දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 10, රූඩ් 02ක් වූ රජයේ ඉඩම් කොටස කෘෂිකාර්මික කටයුත්තක් සඳහා රණසිංහගේ කරුණාරත්න මයා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

**කැබලි අංක 01**

| | |
|---|---|
| *උතුරට* | : ප්‍රාදේශීය සභා මාර්ග රක්ෂිතය |
| *නැගෙනහිරට* | : අතුරු පාර මාර්ග රක්ෂිතය |
| *දකුණට* | : ආසිරි ගොවිපළ |
| *බටහිරට* | : ප්‍රාදේශීය සභා මාර්ග රක්ෂිතය |

**කැබලි අංක 02**

| | |
|---|---|
| *උතුරට* | : ටී. එම්. ජයරත්නට අයත් හේන |
| *නැගෙනහිරට* | : වන රක්ෂිතය |
| *දකුණට* | : ඩී. එම්. සෙනෙවිරත්නට අයත් හේන |
| *බටහිරට* | : අතුරු පාර මාර්ග රක්ෂිතය |

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(අ) *බදු කාලය.* - අවුරුදු තිහයි. (30) (2020.09.29 සිට 2050.09.28 දක්වා);

(ආ) *වාර්ෂික බදු මුදල* .- 2020 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි. 2020 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ හෝ පහකට (රු. 5,000,000) වඩා වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ට නොවැඩි විය යුතුය.

*වාර මුදල* : වාර මුදලක් අය නොකෙරේ.

(ඇ) මෙම ඉඩම කෘෂිකාර්මික කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(ඈ) මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

(ඉ) පළාත් ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය.

(ඊ) සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(උ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(ඌ) 2020.09.29 සිට අවුරුදු 05ක් ගත වන තුරු අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(එ) බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවක දී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10%ක දඩ පොළියක් අය කරනු ලැබේ.

මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2026 ජනවාරි මස 14 දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ අංක 1200/6 හි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

01-309

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.